# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2018 අප්‍රේල් මස 06 වන දින

## II වන කොටස

## අතිරේකය

(2018.04.11 දින නිකුත් කරන ලදී)


# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය

**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය පිහිටුවීම, පවත්වාගෙන යාම සහ පරිපාලනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, විශ්වවිද්‍යාල මට්ටමෙන් උසස් අධ්‍යාපනය ලබාදීම පිණිස ද, කඳවලවත්ත හා එහි ඇති වංවල දේපළ විශ්වවිද්‍යාලය වෙත පැවරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය පනත ඉවත් කිරීම පිණිස ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.**

ආරක්ෂක අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 68.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 15.00 යි.

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය

එල්.ඩී.-ඕ. 4/2009.

**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය පිහිටුවීම, පවත්වාගෙන යෑම සහ පරිපාලනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, විශ්වවිද්‍යාල මට්ටමෙන් උසස් අධ්‍යාපනය ලබාදීම පිණිස ද, කඳවලවත්ත හා එහි ඇති චංචල දේපළ විශ්වවිද්‍යාලය වෙත පැවරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය පනත ඉවත් කිරීම පිණිස ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

පූර්විකාව.

ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල සහ රාජ්‍ය සේවයේ සේවය කිරීමට අපේක්ෂා කරන තැනැත්තන්ට සහ වෙනත් තැනැත්තන්ට ද ශාස්ත්‍රීය සහ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමට සැලැස්වීමේ අවස්ථා මුදුන් පමුණුවා ගැනීමට ඇති අවශ්‍යතාව සහ එහි වැදගත්කම සැලකිල්ලට ගනිමින් ද:

තව ද, ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල සහ රාජ්‍ය සේවයේ සේවය කිරීමට අපේක්ෂා කරන එවැනි තැනැත්තන්ට සහ වෙනත් තැනැත්තන්ට ද ශාස්ත්‍රීය සහ වෘත්තීය සුදුසුකම් ලබාදීමේ කාර්ය සඳහා විශ්වවිද්‍යාලයක් පිහිටුවීම ජාතික වැදගත්කමක් සහිත කාරණයක් බවට පත්ව ඇති හෙයින් ද:

අභාවප්‍රාප්ත සී.එච්, කේ.බී.ඊ. නාමධාරී, නීති ආචාර්ය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් ලයනල් කොතලාවලට අයත් වූ සහ ඔහු සන්තකයෙහි පැවති කඳවල වත්ත නමින් හඳුන්වනු ලබන ඉඩම සහ පරිශ්‍රය සහ යම් වෙනත් චංචල දේපළ, එකී ශ්‍රීමත් ජෝන් ලයනල් කොතලාවල විසින් පරම හා අවලංගු කළ නොහැකි ත්‍යාගයක් ලෙස හා ත්‍යාගයක ආකාරයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පවරනු ලැබූ හෙයින් ද:

තව ද, ජාතියට හා ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල සේවය කිරීමට අපේක්ෂා කරන තැනැත්තන්ට උසස් අධ්‍යාපනය සහ විශ්වවිද්‍යාල මට්ටමින් පුහුණුව ලබාදීම පිණිස රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලයක් පිහිටුවීමේ කාර්ය සඳහා එකී ඉඩම සහ පරිශ්‍රය

සහ චංචල දේපළ භාවිත කරනු ලැබීම අභාවප්‍රාප්ත සී.එච්, කේ.බී.ඊ.නාමධාරී, නීති ආචාර්ය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් ලයනල් කොතලාවලගේ අපේක්ෂාව සහ අභිලාෂය වූ හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.**

1. මෙම පනත 2018 අංක දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, මෙම පනතේ විධිවිධාන, *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය පිහිටුවීම.

**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය පිහිටුවීම.**

2. (1) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ කුමක් සඳහන් වුවද, එය නොතකා (මෙහි මින්මතු "විශ්වවිද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය නම් වූ විශ්වවිද්‍යාලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) විශ්වවිද්‍යාලයෙ අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිත සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, (1) වන උපවගන්තිය මගින් එයට පවරා ඇති නාමයෙන් එය විසින් හා එයට එරෙහිව සියලු අධිකරණයන්හි නඩු පැවරීම සහ පවරනු ලැබීම කරනු ලැබිය හැකි ය.

**විශ්වවිද්‍යාලයේ මුද්‍රාව.**

3. (1) පොදු මුද්‍රාවක් තබාගැනීමට හා භාවිත කිරීමට විශ්වවිද්‍යාලය සතුව සම්පූර්ණ බලය තිබිය යුතු ය.

(2) විශ්වවිද්‍යාලයේ මුද්‍රාව, විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ භාරයේ තිබිය යුතු අතර, විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට එය වෙනස් කළ හැකි ය.

(3) මුද්‍රාව, උපකුලපතිවරයා ඉදිරිපිට දී හෝ උපකුලපතිවරයා විසින් ඒ සඳහා බලය පවරනු ලැබ ඇති වෙනත් යම් නිලධරයකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, උපකුලපතිවරයා හෝ එම නිලධරයා විසින් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන්, එම සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය.

II වන කොටස

**විශ්වවිද්‍යාලයේ අරමුණු සහ බලතල**

විශ්වවිද්‍යාලයේ අරමුණු.

4. විශ්වවිද්‍යාලයේ අරමුණු පහත සඳහන් පරිදි විය යුතු ය:-

(අ) සන්නද්ධ වෘත්තියට කැඩෙට් නිලධරයන් හඳුන්වාදීම සඳහා පහසුකම් සැලසීම සහ ඔවුනට සන්නද්ධ හමුදාවල අධිකාරියට පත්කිරීමට පෙර සන්නද්ධ වෘත්තියට අදාළව ඔවුන්ගේ දැනුම සහ නිපුණතා වර්ධනය කිරීම සඳහා ඔවුන් යොමුකිරීම;

(ආ) කැඩෙට් නිලධරයන්ට, සන්නද්ධ හමුදාවල නිලධරයන්ට, නිලධරයන්ට, රාජ්‍ය සේවකයන්ට සහ වෙනත් තැනැත්තන්ට උපාධි, ඩිප්ලෝමා සහ අනෙකුත් ශාස්ත්‍රීය ප්‍රවීණතා ප්‍රදානය කිරීමට හේතුවන්නා වූ අධ්‍යයන අංශයන් සම්බන්ධයෙන් අධ්‍යයන පාඨමාලා සහ උපදෙස් සැපයීම;

(ඇ) කැඩෙට් නිලධරයන්ගේ චරිතය, ආත්ම විශ්වාසය සහ නායකත්ව ගුණාංග වැඩිදියුණු කිරීම සඳහා කැඩෙට් නිලධරයන් අතර මිත්‍රත්වය පිළිබඳ හැඟීම් සහ හොඳහිත නංවාලීම සහ ඔවුන් අතර අවබෝධය ප්‍රවර්ධනය කිරීම;

(ඈ) එවැනි අධ්‍යයන පාඨමාලා හැදෑරීම සහ උපදෙස් පිළිපැදීම සඳහා කැඩෙට් නිලධරයන්, නිලධරයන්, රාජ්‍ය නිලධරයන් සහ වෙනත් තැනැත්තන් ඇතුළත් කර ගැනීම සහ අධ්‍යයන අංශයන්හි ලැබූ ප්‍රවීණත්වය සහ එම අධ්‍යයන ක්ෂේත්‍රවල ලැබූ ප්‍රවීණත්වය නිශ්චය කරගැනීමේ කාර්ය සඳහා විභාග පැවැත්වීම.

විශ්වවිද්‍යාලයේ බලතල සහ කර්තව්‍ය.

**5.** මේ පනතේ විධිවිධානවලට යටත්ව, විශ්වවිද්‍යාලයට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය:-

(අ) සන්නද්ධ හමුදාවල කැඩෙට් නිලධරයන් සහ නිලධරයන්, රාජ්‍ය නිලධරයන් සහ වෙනත් තැනැත්තන් අධ්‍යයන සහ උපදෙස් පාඨමාලාවන් හැදෑරීමට ඇතුළත් කර ගැනීම;

(ආ) කැඩෙට් නිලධරයන්ට මූලික සේවා පුහුණුවක් ලබා දීම;

(ඇ) කැඩෙට් නිලධරයන්ට, නිලධරයන්ට, රාජ්‍ය නිලධරයන්ට සහ වෙනත් තැනැත්තන්ට අදාළ විය හැකි යම් විෂයයන් සම්බන්ධ ශාස්ත්‍රීය අධ්‍යයනයන් සඳහා පහසුකම් සහ උපදෙස් ලබා දීම;

(ඈ) නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ආරක්ෂාව සම්බන්ධයෙන් වන අධ්‍යයන අංශයන් සහ වෙනත් යම් අධ්‍යයන ක්ෂේත්‍රවලට අදාළව 19(1)(ආ) වගන්තිය යටතේ අනුමත කරනු ලැබිය හැකි උපාධි, ඩිප්ලෝමා, සහතිකපත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කරනු ලබන අධ්‍යයන පාඨමාලා, පුහුණු පාඨමාලා හා උපදේශන ලබා දීම;

(ඉ) කැඩෙට් නිලධරයන්, සන්නද්ධ හමුදාවල නිලධරයන්, නිලධරයන්, රාජ්‍ය නිලධරයන් සහ වෙනත් තැනැත්තන් විසින් එම අධ්‍යයන පාඨමාලා සහ එම අධ්‍යයන ක්ෂේත්‍රවල අත්කරගනු ලැබූ නිපුණතාව සහ කාර්ය සාධනය නිශ්චය කිරීම සඳහා විභාග පැවැත්වීම;

(ඊ) රාජ්‍ය ආරක්ෂාව සහ වෙනත් යම් අධ්‍යයන ක්ෂේත්‍රවලට අදාළ පර්යේෂණ පැවැත්වීම සඳහා සහ දැනුම වැඩිදියුණු කිරීම සහ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා අවස්ථා සැලසීම;

(උ) විශ්වවිද්‍යාලය විසින් නියම කර ඇති නිර්ණායකවලට අනුකූලව සහ විශ්වවිද්‍යාලයේ අධීක්ෂණය යටතේ, වෙනත් යම් නීතියක් යටතේ පිහිටුවන ලද හමුදා පුහුණු ආයතන හෝ මේ පනත යටතේ පිහිටුවන ලද වෙනත් ශාස්ත්‍රීය ආයතන විසින් පවත්වන ලද පාඨමාලා පිළිගැනීමට සහ එම පාඨමාලා සඳහා උපාධි ප්‍රදානය කිරීම;

(ඌ) විශ්වවිද්‍යාලයේ අරමුණුවලට අවශ්‍ය විය හැකි කාර්මික, වෘත්තීය හෝ වෘත්තීමය ආයතන ද ඇතුළුව දේශීය හා විදේශීය උසස් අධ්‍යාපන ආයතන සමග අනුබද්ධව කටයුතු කිරීම;

(එ) මහජනතාවට හෝ යම් ආයතනයකට සපයනු ලබන අධ්‍යාපනික හා වෘත්තීය ඇතුළු යම් අධ්‍යයන, පුහුණු හා උපදෙස් පාඨමාලාවල ප්‍රතිපාදන සඳහා ගාස්තු අය කිරීම සහ එසේ ජනනය වූ ආදායම යම් නියමාවලි මඟින් නියම කරනු ලැබිය යුතු යම් ආකාරයකට විශ්වවිද්‍යාලයේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා යොදා ගැනීම;

(ඒ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 128 වන වගන්තියේ විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන් වුව ද, විශ්වවිද්‍යාලයේ එම ඉගෙනුම් අංශවල අධ්‍යයන පාඨමාලා හදාරා තත්කාර්ය සඳහා සාදන ලද යම් ප්‍රඥප්තිවලට අනුකූලව එම විභාග සමත් වී ඇති කැඩෙට් නිලධරයන්ට, සන්නද්ධ හමුදාවල නිලධරයන්ට, රාජ්‍ය නිලධරයන්ට සහ වෙනත් තැනැත්තන්ට උපාධි, ඩිප්ලෝමා සහ සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සහ පිරිනැමීම;

(ඔ) තත්කාර්ය සඳහා සාදන ලද ව්‍යවස්ථාවලට අනුකූලව පාලක මණ්ඩලය විසින් අනුමත කරනු ලබන තැනැත්තන්ට ගෞරව උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිරිනැමීම;

(ඕ) විශ්වවිද්‍යාලයේ කාර්ය සඳහා ශික්ෂණ රෝහල්, පුස්තකාල, වෛද්‍ය සහ අනෙකුත් රසායනාගාර සහ වෙනත් ගොඩනැගිලි සහ පහසුකම් ඇති කිරීම, ඒවාට උපකරණ සවිකිරීම සහ ඒවා පවත්වාගෙන යාම;

(ක) විශ්වවිද්‍යාලයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරු, මහාචාර්ය තනතුරු, සහාය මහාචාර්ය තනතුරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු, කථිකාචාර්ය තනතුරු සහ වෙනත් අධ්‍යයන සහ අනධ්‍යයන තනතුරු ඇති කිරීම;

(ග) තත්කාර්යය සඳහා සාදනු ලබන යම් ප්‍රඥප්තියකට අනුකූලව අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණා, ශිෂ්‍යාධාර,

පදක්කම් සහ වෙනත් ත්‍යාග ඇති කිරීම සහ ප්‍රදානය කිරීම;

(ච) විශ්වවිද්‍යාලයට අවශ්‍ය විය හැකි පරිදි වූ මණ්ඩප, විද්‍යාල, පීඨ, අධ්‍යනාංශ, මධ්‍යස්ථාන, ශාස්ත්‍රීය ආයතන සහ වෙනත් යම් විශේෂිත ආයතන පිහිටුවීම;

(ජ) විශ්වවිද්‍යාලයේ පරමාර්ථවලට සමාන හෝ සාරානුකූලව සමාන පරමාර්ථ ඇති දේශීය හෝ විදේශීය වෙනත් ආයතන සමග කථිකාචාර්යවරුන්, ශිෂ්‍යයන් සහ ශාස්ත්‍රධරයන් හුවමාරු කරගැනීම මගින් හෝ අන්‍යාකාරයෙන් එම ආයතන සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම;

(ට) තොරතුරු, දැනුම සහ සම්පත් ව්‍යාප්ත කිරීම සහ බෙදා ගැනීමේ කාර්යය ඇතුළුව විශ්වවිද්‍යාලයේ අරමුණු සඳහා රජයේ සහ පුද්ගලික අංශයේ වෙනත් යම් ආයතන සමග සම්බන්ධීකරණය;

(ඩ) විශ්වවිද්‍යාලය විසින් සේවයේ නියුක්ත කොට ඇති තැනැත්තන්ට උසස් අධ්‍යාපනය සඳහා පහසුකම් ලබාදීම;

(ණ) විශ්වවිද්‍යාලයට ශිෂ්‍යයන් ඇතුළත් කරගැනීමේ කාර්යය සඳහා, තත්කාර්ය සඳහා සාදන ලද යම් ප්‍රඥප්තියකට අනුකූලව පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවනු ලැබූ ලෙස සැලකෙන යම් විශ්වවිද්‍යාලයක සහ දේශීය හෝ විදේශීය කාර්මික, වෘත්තීය හෝ වෘත්තීමය ආයතන ඇතුළුව යම් උසස් අධ්‍යාපන ආයතනවල දී තැනැත්තන් විසින් සමත් වනු ලැබූ විභාග සහ ඒ සඳහා ගතකරනු ලැබූ අධ්‍යයන කාලසීමාවන් පිළිගැනීම;

(ත) දේශීය හෝ විදේශීය ප්‍රභවවලින් ලැබෙන දීමනා, ත්‍යාග හෝ පරිත්‍යාග බාරගැනීම;

(ද) මේ පනත මගින් හෝ යම් මිලදී ගැනීමක්, දීමනාවක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් හෝ අන්‍යාකාරයෙන් විශ්වවිද්‍යාලයට පවරනු ලැබිය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළ ලබාගැනීම හෝ දරාසිටීම

සහ එවැනි යම් චංචල හෝ නිශ්චල දේපළක් විකිණීම, උකස් කිරීම, බදු දීම, ප්‍රදානය කිරීම, පැවරීම, වෙනස් කරදීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම:

එසේ වුව ද, යම් දේපළක් විශ්වවිද්‍යාලය වෙත පවරන ලද්දේ යම් සාධන පත්‍රයක් හෝ නියමයක් මගින් හෝ නීතියක් මගින් ද, එම සාධන පත්‍රය, නියමය හෝ නීතිය මගින් පනවන ලද යම් සීමා කිරීමක්, කොන්දේසියක් හෝ තහනමක් උල්ලංඝනය කරනු ලබමින් එම දේපළ විකිණීමක්, උකස් කිරීමක්, බදුදීමක්, හුවමාරු කිරීමක් හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමක් කරනු ලබන්නේ නම් එය අවලංගු විය යුතු ය;

(න) විශ්වවිද්‍යාලය විසින්, කෙලින්ම හෝ තත්කාර්ය සඳහා බලය ලබාදී ඇති යම් නිලධරයකු හෝ නියෝජිතයකු මගින් විශ්වවිද්‍යාලයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි වූ සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම්වලට ඇතුළත් වීම සහ ඉටු කිරීම හෝ ක්‍රියාවට නැංවීම;

(ප) පාලක මණ්ඩලය විසින් සුදුසු යැයි සලකනු ලබන යම් ආකාරයකින් සහ යම් ඇප මත විශ්වවිද්‍යාලයේ කාර්ය සඳහා මුදල් ණයට ලබා ගැනීම හෝ එකතු කිරීම;

(බ) විශ්වවිද්‍යාලයේ කර්තව්‍ය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය වන්නා වූ යම් සේවකයන් සහ නියෝජිතයන් පත්කිරීම සහ එම සේවකයන් සහ නියෝජිතයන්ට පාරිශ්‍රමික ලබාදීම;

(ම) පාලක මණ්ඩලය විසින් සුදුසු යැයි සලකනු ලැබිය හැකි යම් ආකාරයකට විශ්වවිද්‍යාලයේ අරමුදල් ආයෝජනය කිරීම; සහ

(ය) මේ පනත මගින් පවරා දී ඇති බලතලවලින් යම් බලතල එලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සහ විශ්වවිද්‍යාලයේ සියලුම අරමුණු සහ ඉන් කිසිවක් සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය විය හැකි අනිකුත් සියලු ක්‍රියා හෝ දේ ඉටු කිරීම.

## III කොටස

### අමාත්‍යවරයාගේ බලතල

**6.** (1) අමාත්‍යවරයා මේ පනතේ සාමාන්‍ය විධානය සහ පරිපාලනය සම්බන්ධයෙන් වගකිව යුතු ය.

අමාත්‍යවරයාගේ වගකීම සහ බලතල.

(2) අමාත්‍යවරයා විසින්, කලින් කලට, ඔහු විසින් අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි කාරණා සම්බන්ධයෙන් පාලක මණ්ඩලය වෙත ලිඛිත විධාන නිකුත් කරනු ලැබිය හැකිය. මේ උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම ලිඛිත විධානයක්ම එම නිකුත් කිරීමේ දින සිට මාස තුනක් ඇතුළත දී පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන සෑම විධානයකටම අනුකූලව ක්‍රියා කිරීම පාලක මණ්ඩලයේ කාර්යය විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් කලින් කලට, විශ්වවිද්‍යාලය සමග අනුබද්ධ ආයතනවල ලැයිස්තුවක්, ගැසට් පත්‍රයේ පළකිරීමට පාලක මණ්ඩලයට විධාන කරනු ලැබිය යුතු ය.

**7.** විශ්වවිද්‍යාලය තුළ පවතින යම් තත්ත්වයක් ජාතික ආරක්ෂාවට අනතුරුදායක වීමේ නැඹුරුවක් පවතින බවට හෝ ජාතික ප්‍රතිපත්තියට අහිතකර හෝ අගතිදායක බව නැතහොත් එම තත්ත්වය මගින් විශ්වවිද්‍යාලයේ නිසි ක්‍රියාකාරිත්වය බිඳ වැටීමේ නැඹුරුවක් ඇති බවට අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක, එම තත්ත්වය පාලනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි යැයි ඔහු විසින් සලකනු ලබන සියලු පියවර ගන්නා ලෙස අමාත්‍යවරයා විසින් පාලක මණ්ඩලයට විධාන කරනු ලැබිය හැකි ය.

ජාතික ආරක්ෂාව වැනි අවස්ථාවන්හිදී අමාත්‍යවරයා විසින් විධාන දිය යුතු බව.

**8.** 18 වන වගන්තියේ සඳහන් කරනු ලබන පාලක මණ්ඩලය විසින්, එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු මාස හයක කාලයක් ගතවීමට පෙර, අදාළ වර්ෂය ඇතුළත සිය කටයුතු පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ඇතුළත් වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එම වාර්තාවේ පිටපත් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු සිදු කළ යුතු ය.

වාර්ෂික වාර්තාව.

## IV වන කොටස

## විශ්වවිද්‍යාලයේ කුලපතිවරයා සහ නිලධරයන්

විශ්වවිද්‍යාලයේ කුලපතිවරයා සහ නිලධරයන්.

**9.** (1) (මෙහි මින්මතු "කුලපතිවරයා" යනුවෙන් හඳුන්වනු ලබන) ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබිය යුතු විශ්වවිද්‍යාලයේ කුලපතිවරයකු සිටිය යුතු ය.

(2) කුලපතිවරයා විශ්වවිද්‍යාලයේ නාමික ප්‍රධානියා විය යුතු අතර, ඔහු, පත්කරන ලද දිනයේ සිට අවුරුදු පහක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය.

(3) කුලපතිවරයා විසින්, 25 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව විශ්වවිද්‍යාලයේ යම් උපාධි ප්‍රදානෝත්සවයකට පැමිණ සිටින විට එහි මුලසුන දැරිය යුතු ය.

(4) මරණය සිදුවීම, ජනාධිපතිවරයා අමතා කරනු ලබන ඉල්ලා අස්වීම හෝ ජනාධිපතිවරයා විසින් ඉවත් කිරීම මගින් කුලපතිවරයා විසින් තම ධුරය හිස්කරනු ලබන අවස්ථාවක, එම කුලපතිවරයා වෙනුවට අනුප්‍රාප්තිකයා ලෙස පත්කරනු ලබන තැනැත්තා ඔහුගේ පූර්වගාමිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරි වී ඇති ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(5) විශ්වවිද්‍යාලයේ අනෙකුත් නිලධරයන් පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) උපකුලපතිවරයා;

(ආ) මණ්ඩපවල ප්‍රධානීන්;

(ඇ) නියෝජ්‍ය උපකුලපතිවරයා (ආරක්ෂක සහ පරිපාලන);

(ඈ) නියෝජ්‍ය උපකුලපතිවරයා (ශාස්ත්‍රීය);

(ඉ) සෑම පීඨයකම පීඨාධිපතිවරු;

(ඊ) මූලස්ථාන බලඇණියේ සේනාංකයේ අණදෙන නිලධරයා;

(උ) සහායක නිලධරයා;

(ඌ) ලේඛකාධිකාරීවරයා;

(එ) පුස්තකාලයාධිපතිවරයා;

(ඒ) මූල්‍යාධිකාරීවරයා.

උප කුලපතිවරයා.

**10.** (1) ජනාධිපතිවරයා විසින් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වශයෙන් සන්නද්ධ හමුදාවල ජ්‍යෙෂ්ඨ නිලධරයකු පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා සන්නද්ධ හමුදාවල යම් ජ්‍යෙෂ්ඨ නිලධරයකු පිළිවෙළින්, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙන්, ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් හා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් සේවා මාරු ක්‍රමයට පත් කර ගනු ලැබිය යුතු ය.

(3) උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධරයකු විය යුතු අතර, ඔහු විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධරයා සහ පරිපාලන නිලධරයා ද, ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා ද වන්නේ ය. උපකුලපතිවරයාට විශ්වවිද්‍යාලයේ යම් කෘත්‍යමය ආයතනයක හෝ වෙනත් මණ්ඩලයක යම් රැස්වීමක් කැඳවීමට, ඊට සහභාගි වීමට සහ යම් රැස්වීමක කතා කිරීමට හිමිකම ඇත්තේ ය.

(4) පාලක මණ්ඩලය විසින් තත්කාර්ය සඳහා උපකුලපතිවරයා වෙත නීත්‍යනුකූලව දෙනු ලබන යම් විධානයන්ට අනුකූලව මේ පනතේ විධිවිධාන සහ මේ පනත යටතේ සාදන ලද යම් අනුනීති, ඔහු විසින් බලතල ක්‍රියාත්මක කිරීමේ දී යථා පරිදි පිළිපදින බවට සහතික වීම, උපකුලපතිවරයාගේ කාර්යය වන්නේ ය.

(5) මේ පනතේ විධිවිධානවලට යටත්ව, පාලක මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම සහ ක්‍රියාත්මක කරන බවට වගබලා ගැනීම උප කුලපතිවරයාගේ කාර්යය වන්නේ ය.

(6) (අ) උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ ගිණුම් නිලධරයා විය යුතු ය.

(ආ) උපකුලපතිවරයා, විශ්වවිද්‍යාලය තුළ විනය පාලනය පවත්වාගෙන යාම සඳහා වගකිව යුතු අතර, ඔහුට විශ්වවිද්‍යාලයේ

යම් කැඩෙට් නිලධරයකු හෝ යම් ශිෂ්‍යයකු හෝ කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් කරනු ලබන විනය කඩකිරීමක් සම්බන්ධ චෝදනා සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා විධාන කළ හැකි ය.

(ඇ) පාලක මණ්ඩලය විසින්, නියම කරනු ලබන නියමාවලියක් මගින් එම විනය පරීක්ෂණය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය නියම කළ යුතු ය.

(7) උපකුලපතිවරයා මරණය සිදුවීම, විශ්‍රාම යාම හෝ මාරුකිරීම මගින් කලින් ධුරය අත්හළහොත් මිස, අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර, නැවත පත්කිරීම සඳහා සුදුසුකම් ලබන්නේ ය. යම් තැනැත්තකු විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වශයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක් සඳහා පත් කරනු නොලැබිය යුතු ය.

(8) උපකුලපතිවරයා විසින් තත්කාර්යය සඳහා පාලක මණ්ඩලය හරහා ජනාධිපතිවරයා අමතා කරනු ලබන ලිඛිත සන්නිවේදනයක් මගින් ඔහුගේ උපකුලපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(9) ජනාධිපතිවරයා විසින් හේතු දක්වා උපකුලපතිවරයා ධුරයෙන් ඉවත් කළහැකි ය.

(10) නිවාඩු ලබා තිබීම, රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා උපකුලපතිවරයාට තම ධුරයේ කටයුතු ඉටුකිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් එම ධුරයේ කටයුතු කිරීම සඳහා ඔහු විසින් සුදුසුයැයි සලකනු ලබන එවැනි වැඩපිළිවෙළක් සලස්වනු ලැබිය හැකි ය. එවැනි වැඩපිළිවෙළක් සලස්වනු ලබන තෙක් විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපතිවරයා (ආරක්ෂක සහ පරිපාලන) විසින් උපකුලපතිවරයාගේ ධුරයේ එදිනෙදා කටයුතු ඉටු කළ යුතු ය.

(11) උපකුලපතිවරයාගේ ධුරයේ යම් පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, ස්ථිර පත්කිරීමක් කරනු ලබන තෙක් එම ධුරයේ කාර්යයන් කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් සුදුසුයැයි සලකනු ලබන වැඩපිළිවෙළක් සකස් කළ යුතු ය. එවැනි යම් වැඩපිළිවෙළක්

සලස්වනු ලබන තෙක් විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපතිවරයා (ආරක්ෂක සහ පරිපාලන) විසින් උපකුලපතිවරයාගේ ධුරයේ එදිනෙදා කාර්ය ඉටුකළ යුතු ය.

(12) ජනාධිපතිවරයා විසින් 10 වන උපවගන්තියේ කාර්යය සඳහා උපකුලපතිවරයකු පත් කරනු ලබන අවස්ථාවක දී, එම උපකුලපතිවරයා විශ්‍රාම යන්නේ නම් හෝ ධුරය හිස් කරයි නම් මිස, ඔහු, ඔහුගේ පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(13) මේ වගන්තියේ කාර්යය සඳහා "සන්නද්ධ හමුදාවල ජ්‍යෙෂ්ඨ නිලධරයකු" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා යුධ හමුදාව සම්බන්ධයෙන් වන විට, මේජර් ජෙනරාල් තනතුරට අඩු නොවන තනතුරක් දරන නිලධරයකු;

(ii) ශ්‍රී ලංකා නාවික හමුදාව සම්බන්ධයෙන් වන විට, රියර් අද්මිරාල් තනතුරට අඩු නොවන තනතුරක් දරන නිලධරයකු;

(iii) ශ්‍රී ලංකා ගුවන් හමුදාව සම්බන්ධයෙන් වන විට, එයාර් වයිස් මාෂල් තනතුරට අඩු නොවන තනතුරක් දරන නිලධරයකු, අදහස් වන්නේ ය.

**11.** (1) පාලක මණ්ඩලය විසින් පත්කරනු ලබන විශ්වවිද්‍යාලයේ මණ්ඩපයක අධිපතිවරයකු සිටිය යුතු ය. මණ්ඩපයක අධිපතිවරයා.

(2) ඔහු, මණ්ඩපයක ශාස්ත්‍රීය සහ පරිපාලනමය ප්‍රධානියා විය යුතු ය.

**12.** (1) නියෝජ්‍ය උපකුලපතිවරයා (ආරක්ෂක සහ පරිපාලන) විධායක සහ පරිපාලන කර්තව්‍යය ඉටුකිරීමේ දී උපකුලපතිවරයාට සහාය විය යුතු ය. විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපතිවරයා.

(2) නියෝජ්‍ය උපකුලපතිවරයා (ශාස්ත්‍රීය) විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය කර්තව්‍යය ඉටුකිරීමේ දී උපකුලපතිවරයාට සහාය විය යුතු ය.

**13.** (1) එක් එක් පීඨයේ ශාස්ත්‍රීය ප්‍රධානියා විය යුතු පීඨාධිපතිවරයකු සිටිය යුතු ය. උපකුලපතිවරයා විසින් පාලක පීඨයේ පීඨාධිපතිවරයා.

මණ්ඩලයේ අනුමැතිය ඇතිව පීඨාධිපතිවරයා පත් කරනු ලැබිය යුතු ය.

(2) පීඨාධිපතිවරයා, මේ පනත යටතේ සාදන ලද යම් අනුනීති වල විධිවිධානවලට යටත්ව, සිය පත්වීමේ දින සිට ගණන් කරනු ලබන අවුරුදු තුනක කාලසීමාවක් සඳහා ධුර දැරිය යුතු අතර, එම ධුරය දැරීමට නුසුදුස්සකු වන්නේ නම් මිස වැඩිදුරටත් වූ අවුරුදු තුනක කාලයක් සඳහා නැවත පත්කිරීම පිණිස සුදුසුකම් ලබන්නේ ය.

(3) නිවාඩු ලබා තිබීම, රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා පීඨයක පීඨාධිපතිවරයකුට මාස තුනකට නොවැඩි කාලයක් සඳහා සිය ධුරයේ කාර්යය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, උපකුලපතිවරයා විසින් එම කාලසීමාව සඳහා පීඨාධිපති ධුරයේ කටයුතු කිරීමට තැනැත්තකු පත්කළ යුතු ය.

(4) යම් පීඨයක පීඨාධිපතිවරයකු ඉවත් කරනු ලැබීම, විශ්‍රාම ගැනීම, ඉල්ලා අස්වීම හෝ යම් වෙනත් හේතුවක් නිසා ඔහුගේ කාර්යය ඉටුකිරීමට නොහැකි වන අවස්ථාවක, උපකුලපතිවරයා විසින්, පාලක මණ්ඩලයේ අනුමතය සහිතව පීඨාධිපතිවරයකු පත්කරනු ලැබිය යුතු අතර, එසේ පත්කරනු ලැබූ පීඨාධිපතිවරයා ඔහුගේ පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා පීඨාධිපති ධුරය දැරිය යුතු ය.

විශ්වවිද්‍යාලයේ සහායක නිලධරයා.

**14.** (1) විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය මගින් පත්කරනු ලබන ශ්‍රී ලංකා යුධ හමුදාවේ ලුතිනන් කර්නල්වරයකුගේ පදවියේ නිලධරයකු විය යුතු සහායක නිලධරයකු සිටිය යුතු ය.

(2) සහායක නිලධරයා විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධරයකු ලෙස කටයුතු කළ යුතු ය.

(3) සහායක නිලධරයා උපකුලපතිවරයාගේ විධානයට සහ පාලනයට යටත්ව -

(අ) විශ්වවිද්‍යාලයේ කැඩෙට් නිලධරයන්ගේ සහ සේවා අයවලුන්ගේ විනය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වගකිව යුතු ය;

(ආ) විශ්වවිද්‍යාලයේ ආරක්ෂාව සහතික කිරීමට වගකිව යුතු ය;

(ඇ) ස්ථාවර නියෝග සෑදීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ය; සහ

(ඈ) අවි, පුපුරන ද්‍රව්‍ය සහ අවි ආයුධ සහ යුද්ධමය ද්‍රව්‍ය භාරව සිටිය යුතු ය.

**විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා.**

**15.** (1) විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා, නියමාවලිය මඟින් නියම කරනු ලැබිය යුතු සංයුතියකින් යුක්ත වූ තේරීම් කමිටුවක නිර්දේශ මත පාලක මණ්ඩලය විසින් පත් කර ගත යුතු ය.

(2) ලේඛකාධිකාරීවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධරයකු ලෙස කටයුතු කළ යුතු ය.

(3) ලේඛකාධිකාරීවරයා උපකුලපතිවරයාගේ විධානයට සහ පාලනයට යටත්ව-

(අ) විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයාගේ කාර්යාලයේ පරිපාලනය සඳහා වගකිව යුතු වන්නේ ය;

(ආ) 14 (3) (ඈ) වගන්තියේ සඳහන් කර ඇති අවි පුපුරණ ද්‍රව්‍ය සහ අවිආයුධ සහ යුධමය ද්‍රව්‍ය හැර විශ්වවිද්‍යාලයේ වාර්තා සහ දේපළවල භාරකාරීත්වය සඳහා වගකිව යුතු වන්නේ ය;

(ඇ) මේ පනත යටතේ ඔහු වෙත ප්‍රදානය කර ඇති හෝ පනවා ඇති හෝ පවරා දී ඇති යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම කළ යුතු ය.

**විශ්වවිද්‍යාලයේ මුල්‍යාධිකාරීවරයා.**

**16.** (1) විශ්වවිද්‍යාලයේ මුල්‍යාධිකාරීවරයා, නියමාවලිය මගින් නියම කරනු ලැබිය යුතු සංයුතියකින් යුක්ත වූ තේරීම් කමිටුවක නිර්දේශය මත පාලක මණ්ඩලය විසින් පත් කරගත යුතු ය.

(2) මුල්‍යාධිකාරීවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධරයකු වශයෙන් කටයුතු කළ යුතු ය.

(3) මූල්‍යාධිකාරීවරයා උපකුලපතිවරයාගේ විධානයට සහ පාලනයට යටත්ව-

(අ) විශ්වවිද්‍යාලයේ මූල්‍ය කටයුතු පිළිබඳ සාමාන්‍ය පරිපාලනය සඳහා වගකිව යුතු අතර, නියමාවලිය මගින් නියම කරනු ලැබිය හැකි එවැනි ආකාරයකින් සහ එවැනි ආකෘතියකින් සිය ගිණුම් පවත්වාගෙන යා යුතු ය;

(ආ) විශ්වවිද්‍යාලයේ පොදු අරමුදල්වල භාරකාරත්වය දරනු ලැබිය යුතු ය; සහ

(ඇ) මේ පනත මගින් ඔහු වෙත ප්‍රදානය කොට ඇති හෝ පනවා ඇති හෝ පවරා දී ඇති යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති-වරයා.

**17.** (1) විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපතිවරයා, නියමාවලි මගින් නියම කරනු ලැබිය යුතු සංයුතියකින් යුක්ත වූ තේරීම්කමිටුවක නිර්දේශ මත පාලක මණ්ඩලය විසින් තෝරා පත්කර ගත යුතු ය.

(2) පුස්තකාලයාධිපතිවරයා, විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධරයකු වශයෙන් කටයුතු කළ යුතු ය.

(3) පුස්තකාලයාධිපතිවරයා විසින් උපකුලපතිවරයාගේ විධානයට සහ පාලනයට යටත්ව-

(අ) විශ්වවිද්‍යාලයේ පුස්තකාලය හෝ පුස්තකාලවල පරිපාලනය සඳහා වගකිව යුතු ය; සහ

(ආ) මේ පනත මගින් ඔහු වෙත ප්‍රදානය කොට ඇති හෝ පනවා ඇති හෝ පවරා දී ඇති යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

## V වන කොටස

### විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරිය සහ කෘත්‍යමය ආයතන

විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය.

**18.** (1) පාලක මණ්ඩලය (මේ පනතේ මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරිය

වන අතර මණ්ඩලය, මේ පනතේ විධිවිධාන සහ මේ පනත යටතේ සාදන ලද යම් අනුනීතිවලට යටත්ව, විශ්වවිද්‍යාලය වෙත ප්‍රදානය කොට ඇති හෝ පනවා ඇති හෝ පවරා ඇති සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය.

(2) මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු යः—

(අ) ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ආ) ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා;

(ඇ) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා;

(ඈ) ශ්‍රී ලංකා යුධ හමුදාවේ හමුදාපතිවරයා;

(ඉ) ශ්‍රී ලංකා නාවික හමුදාවේ හමුදාපතිවරයා;

(ඊ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හමුදාපතිවරයා;

(උ) විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා;

(ඌ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නාමිකයකු; සහ

(එ) භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන භාණ්ඩාගාරයේ අනුයෝජිතයකු.

(3) ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු අතර, ඔහු මණ්ඩලයේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. සභාපතිවරයාට මෙම රැස්වීමක මුලසුන දැරීමට නොහැකිවේ නම්, අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(4) විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා මණ්ඩලයේ ලේකම්වරයා ලෙස කටයුතු කළ යුතු ය.

(5) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස්දෙනකු විය යුතු ය.

(6) එම සෑම රැස්වීමක් සඳහාම (2) වන උපවගන්තියේ (ඈ), (ඉ) සහ (ඊ) ඡේදවල සඳහන් ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල යම් හමුදාපතිවරයන් දෙදෙනකු එම රැස්වීම සඳහා පැමිණ සිටිය යුතු ය.

(7) මණ්ඩලය අවශ්‍ය යැයි සැලකෙන කවර හෝ අවස්ථාවක රැස්විය යුතු නමුත්, එය යටත් පිරිසෙයින් එක් අවුරුද්දකට හය වතාවකට නොඅඩු වාර ගණනක් රැස්විය යුතු ය.

(8) මණ්ඩලයේ කිසිම ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් සිය සාමාජිකයන් අතර පුරප්පාඩුවක් පැවතීමේ හේතුව නිසා පමණක් අවලංගු නොවිය යුතු ය.

**19.** (1) 18 වන වගන්තිය මගින් මණ්ඩලය වෙත පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කළයුතු යː- මණ්ඩලය සතු බලතල, කාර්ය සහ කර්තව්‍ය.

(අ) විශ්වවිද්‍යාලයට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සඳහා වන නිර්ණායක, කලින් කල නිශ්චය කිරීම;

(ආ) උපාධි, ඩිප්ලෝමා, සහතික පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම පිණිස විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් නියමාවලි මගින් තීරණය කරනු ලැබිය හැකි යම් අධ්‍යයන තත්ත්වයන්ට වඩා අඩු නොවන අධ්‍යයන තත්ත්වයන්ට අනුකූලව අධ්‍යයන පාඨමාලා හා පුහුණු පාඨමාලා අනුමත කිරීම;

(ඇ) විශ්වවිද්‍යාල සඳහා කුල ලාංඡනයක් තෝරා ගැනීම සහ එහි ආකෘතිය නිශ්චය කිරීම;

(ඈ) විශ්වවිද්‍යාලයේ මූල්‍ය අවශ්‍යතා පිළිබඳ කලින් කල පරීක්ෂා කිරීම හෝ විමර්ශනය කිරීම;

(ඉ) විශ්වවිද්‍යාලය සඳහා කලින් කල සංස්ථාපිත ක්‍රමෝපායන් සැලසුම් සහ ඊට අනුරූපී වූ අයවැය අනුමත කිරීම;

(ඊ) ආණ්ඩුවේ සමස්ත පඩි සහ වැටුප් ප්‍රතිපත්තිය ඇතුළත විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික ප්‍රමාණ සහ ඔවුනට ලැබීමට හිමිකම් ඇති වෙනත් ප්‍රතිලාභ කලින් කල නිශ්චය කිරීම;

(උ) විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම් සලකා බැලීම සහ එම වාර්තාව සහ ගිණුම් විශ්වවිද්‍යාලය විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් සංශෝධන ද සමග අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම;

(ඌ) විශ්වවිද්‍යාලයේ අයවැය ඇස්තමේන්තු සහ වාර්ෂික මුදල් විසර්ජන සකස් කොට ඒවා අමාත්‍යවරයාට ඉදිරිපත් කිරීම;

(එ) මේ පනත යටතේ රීති, නියමාවලි, ප්‍රඥප්ති සහ අතුරු ව්‍යවස්ථා සාදනු ලැබීමට නියම කොට ඇති හෝ බලය පවරා ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් රීති, නියමාවලි, ප්‍රඥප්ති සහ අතුරු ව්‍යවස්ථා සකස් කිරීම;

(ඒ) විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ තැනැත්තන්ගේ කාර්ය සාධනය ඇගයීම;

(ඔ) විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය අතරින් හෝ පිටස්තර ස්ථානයකින් විභාග පරීක්ෂකයන් පත් කිරීම සහ එම විභාග පරීක්ෂකයන්ට ගෙවිය යුතු ගාස්තු නිශ්චය කිරීම;

(ඕ) විශ්වවිද්‍යාලය වෙනුවෙන් ගිවිසුම්වලට ඇතුළත් වීම, ගිවිසුම් ක්‍රියාත්මක කිරීම හෝ අවලංගු කිරීම සහ විශ්වවිද්‍යාලය විසින් ජනනය කරනු ලැබූ වියදම් නොකළ යම් ආදායම් ඇතුළු විශ්වවිද්‍යාලයට අයත් යම් මුදල් ශ්‍රී ලංකාවේ නිශ්චල දේපළ මිලදී ගැනීම සඳහා ආයෝජනය කිරීම හෝ එම ආයෝජන වෙනස් කිරීම හෝ එම මුදල්වලින් වහාම වියදම් කිරීම සඳහා අවශ්‍ය නොවන යම් මුදල් ප්‍රමාණයක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් බැංකුවක ස්ථිර තැන්පතු වශයෙන් තැන්පත් කිරීම;

(ක) ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පදවි, මහාචාර්ය පදවි, සහාය මහාචාර්ය පදවි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පදවි, කථිකාචාර්ය

පදවි සහ එවැනි වෙනත් තනතුරු ඇති කිරීම, අවලංගු කිරීම හෝ අත්හිටුවීම;

(ග) යම් අනධ්‍යයන තනතුරක් ඇති කිරීම, අවලංගු කිරීම හෝ අත්හිටුවීම;

(ච) විශ්වවිද්‍යාලයේ යම් අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්ය මණ්ඩලයක් සඳහා අවශ්‍ය සුදුසුකම් තීරණය කිරීම;

(ජ) විශ්වවිද්‍යාලයේ අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ කාර්ය සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ දේශීය හෝ විදේශීය ආයතන සමග සහයෝගිතා සහ හවුල් සම්බන්ධතා පිහිටුවා ගැනීම;

(ට) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණ, ශිෂ්‍යාධාර, පදක්කම් සහ වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම;

(ඩ) තීරණය කරනු ලැබිය හැකි පරිදි මණ්ඩප, විද්‍යාල, පීඨ හා දෙපාර්තමේන්තු, මධ්‍යස්ථාන සහ වෙනත් ආයතන, පාසල් සහ අංශ පිහිටුවා ගැනීම;

(ණ) විශ්වවිද්‍යාලයේ නිලධරයන්ගේ, උපාධිධාරීන්ගේ සහ ශිෂ්‍යයන්ගේ උපාධි නේපථ්‍යය සහ ලාංඡන නිශ්චය කිරීම; සහ

(ත) මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද වෙනත් අන්‍යාකාරයෙන් විධිවිධාන සලසා නොමැති විශ්වවිද්‍යාලයේ වෙනත් යම් සියලු බලතල ක්‍රියාත්මක කිරීම.

(2) මණ්ඩලය විසින්, මේ පනත යටතේ එහි බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, කිරීමේ සහ ඉටු කිරීමේ කාර්ය සඳහා මේ පනත යටතේ හෝ පනත මගින් මණ්ඩලය වෙත ප්‍රදානය කරන ලද හෝ පවරාදෙන ලද යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය උපකුලපතිවරයා වෙත අභිනියෝජනය කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලය විසින් සුදුසු යැයි සලකනු ලබන ස්ථාවර කමිටු, යථා තත්කාර්ය කමිටු හෝ මණ්ඩල යම් සංඛ්‍යාවක් ද විශේෂයෙන්ම පහත දැක්වෙන කමිටු පත්කරනු ලැබිය හැකි ය:—

(i) තත්ත්ව සහතික සහ ප්‍රතීතන කමිටුව;

(ii) ආචාර ධර්ම, උසස් උපාධි සහ පර්යේෂණ කමිටුව;

(iii) විෂය ධාරා සහ ඇගයීමේ කමිටුව;

(iv) නිවාඩු සහ සම්මාන කමිටුව;

(v) කාර්මික - විශ්වවිද්‍යාල හවුල් සම්බන්ධතා කමිටුව;

(vi) මාධ්‍ය සහ තොරතුරු සේවා කමිටුව;

(vii) පුස්තකාල කමිටුව;

(viii) මුල්‍ය කමිටුව;

(ix) විගණන සහ කළමනාකරණ කමිටුව;

(x) නේවාසික, විනය සහ ශිෂ්‍ය කටයුතු පිළිබඳ මණ්ඩලය; සහ

(xi) විභාග මණ්ඩලය.

**20.** (1) විශ්වවිද්‍යාලයේ කෘත්‍යමය ආයතන පහත පරිදි විය යුතු ය:- කෘත්‍යමය ආයතන.

(අ) මූලස්ථානය;

(ආ) සභාව;

(ඇ) සනාතන සභාව; සහ

(ඈ) පීඨ මණ්ඩල.

(2) මණ්ඩලයේ අනුමතයට යටත්ව උපකුලපතිවරයා විසින්, 19 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඔහු වෙත ප්‍රදානය කරන ලද හෝ පනවන ලද හෝ පවරන ලද යම් බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම විශ්ව විද්‍යාලයේ කෘත්‍යමය ආයතන වෙත අභිනියෝජනය කිරීම කරනු ලැබිය හැකි ය.

විශ්වවිද්‍යාලයේ මූලස්ථානය.

**21.** (1) විශ්වවිද්‍යාලයේ මූලස්ථානය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) උපකුලපතිවරයා;

(ආ) නියෝජ්‍ය උපකුලපතිවරයා (ආරක්ෂක සහ පරිපාලන);

(ඇ) අණදෙන නිලධරයා (පරිපාලන);

(ඈ) සහායක නිලධරයා;

(ඉ) ලේඛකාධිකාරීවරයා;

(ඊ) මුල්‍යාධිකාරීවරයා;

(උ) විශ්වවිද්‍යාලයේ සාජන්ට් මේජර්.

(2) මූලස්ථානය විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරි සහ පරිපාලන මණ්ඩලය විය යුතු ය.

සභාව.

**22.** (1) (මෙහි මින්මතු "සභාව" යනුවෙන් හඳුන්වනු ලබන) විශ්වවිද්‍යාලයේ සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:-

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයන්:-

(i) උපකුලපතිවරයා;

(ii) මණ්ඩපවල ප්‍රධානීන්;

(iii) නියෝජ්‍ය උපකුලපතිවරයා (ආරක්ෂක සහ පරිපාලන);

(iv) නියෝජ්‍ය උපකුලපතිවරයා (ශාස්ත්‍රීය);

(v) ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල ප්‍රහුණු අධ්‍යක්ෂවරු;

(vi) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා;

(vii) සහායක නිලධරයා;

(viii) ලේඛකාධිකාරීවරයා; සහ

(ix) මූල්‍යාධිකාරීවරයා;

(ආ) පහත දැක්වෙන නම් කළ සාමාජිකයන්:-

(i) උපකුලපතිවරයා විසින් නම් කරනු ලබන සනාතන සභාවේ වෙනත් සාමාජිකයන් දෙදෙනකු;

(ii) ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ අනුයෝජිතයන් දෙදෙනකු;

(iii) ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, අධ්‍යාපන, වෘත්තීමය, වාණිජ, කාර්මික, විද්‍යාත්මක හෝ පරිපාලනමය ක්ෂේත්‍රවල විශිෂ්ට සේවාවන් ඉටුකර ඇති තැනැත්තන් අතුරින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනකු;

(iv) විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවන ලද බවට සැලකෙන විශ්වවිද්‍යාලයක අනුයෝජිතයකු.

(2) (අ) උපකුලපතිවරයා සභාවේ සභාපතිවරයා විය යුතු අතර, සභාවේ සියලු රැස්වීම්වල මූලසුන දැරිය යුතු ය. උපකුලපතිවරයාට යම් රැස්වීමක මූලසුන දැරීමට නොහැකි වන්නේ නම් නියෝජ්‍ය උපකුලපතිවරයා (ආරක්ෂක සහ පරිපාලන) එවැනි රැස්වීමක මූලසුන දැරිය යුතු ය.

(ආ) විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා සභාවේ ලේකම්වරයා ලෙස කටයුතු කළ යුතු ය.

(3) සභාව, විශ්වවිද්‍යාලයේ උපදේශක මණ්ඩලය ලෙස කටයුතු කළ යුතු ය.

සනාතන සභාව

**23.** (1) විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයන්:-

(i) උපකුලපතිවරයා;

(ii) මණ්ඩපවල ප්‍රධානීන්;

(iii) නියෝජ්‍ය උපකුලපතිවරයා (ආරක්ෂක සහ පරිපාලන);

(iv) නියෝජ්‍ය උපකුලපතිවරයා (ශාස්ත්‍රීය);

(v) ප්‍රතීතන සහ අනුබද්ධ ආයතනවල ප්‍රධානීන්;

(vi) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා;

(vii) සහායක නිලධරයා;

(viii) එක් එක් පීඨයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් දෙදෙනකු;

(ix) ලේඛකාධිකාරිවරයා;

(x) බලසනාධිපතිවරයන්;

(xi) එක් එක් අධ්‍යයන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා;

(xii) ආරක්ෂක සහ ක්‍රමෝපාය අධ්‍යයන පීඨයේ II වන ශ්‍රේණියේ මාණ්ඩලික නිලධරයා; සහ

(xiii) පුස්තකාලයාධිපතිවරයා.

(ආ) පහත දැක්වෙන නම් කළ සාමාජිකයන්:—

(i) උපකුලපතිවරයා විසින් නම් කරනු ලබන මුළු පීඨ සංඛ්‍යාවට සමාන සහාය මහාචාර්යවරු සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු සංඛ්‍යාවක්; සහ

(ii) උපකුලපතිවරයා විසින් නම් කරනු ලබන මුළු පීඨ සංඛ්‍යාවට සමාන කථිකාචාර්යවරු සංඛ්‍යාවක්.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නම් කරනු ලබන එක් එක් සාමාජිකයා, එම සාමාජිකයා නම් කරනු ලබන දිනයේ සිට ගණන් බලන අවුරුදු දෙකක කාලයක් සඳහා ධුර දැරිය යුතු ය.

(3) (අ) උපකුලපතිවරයා සනාතන සභාවේ සභාපතිවරයා විය යුතු අතර, ඔහු සනාතන සභාවේ සෑම රැස්වීමක දී මුලසුන දැරිය යුතු ය. සභාපතිවරයාට යම් රැස්වීමක මුලසුන දැරීමට නොහැකි වන්නේ නම් නියෝජ්‍ය උපකුලපතිවරයා (ආරක්ෂක සහ පරිපාලන) එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(ආ) විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය ලේඛකාධිකාරිවරයා සනාතන සභාවේ ලේකම්වරයා ලෙස කටයුතු කළ යුතු ය.

(4) සනාතන සභාව, විශ්වවිද්‍යාලයේ අධ්‍යයන මණ්ඩලයක් ලෙස කටයුතු කළ යුතු අතර, මණ්ඩලයේ අනුමතය ඇතිව, මණ්ඩලය විසින් සුදුසු යැයි සලකනු ලබන යථා යෝග්‍ය කමිටු පත් කරනු ලැබිය හැකි ය.

පීඨ මණ්ඩලය.

**24.** (1) (අ) විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය අධ්‍යයන පීඨවල පීඨමණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(i) පීඨයේ පීඨාධිපතිවරයා;

(ii) පීඨයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු, මහාචාර්යවරු, සහාය මහාචාර්යවරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු සහ කථිකාචාර්යවරු;

(iii) (ii) වන ඡේදයේ දක්වා ඇති තැනැත්තන් හැර, පීඨයේ උපදෙස් ලබාදෙන ස්ථිර කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු;

(iv) ආරක්ෂක සහ ක්‍රමෝපාය අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයාගේ අනුයෝජිතයකු;

(v) ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරයා;

(vi) සහකාර පුස්තකාලයාධිපති; සහ

(vii) මණ්ඩලය විසින් පීඨයේ අධ්‍යයන අංශවලට අදාළ විශිෂ්ටත්වයක් දරන තැනැත්තන් අතුරින් පත්කරනු ලබන විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් නොවන තැනැත්තන් තුන්දෙනෙකුට නොවැඩි ගණනක්.

(ආ) විශ්වවිද්‍යාලයේ ආරක්ෂක සහ ක්‍රමෝපාය අධ්‍යයන පීඨයේ පීඨ මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(i) පීඨයේ පීඨාධිපතිවරයා;

(ii) ආරක්ෂක අධ්‍යයන දෙපාර්තමේන්තුවේ සහ ක්‍රමෝපාය අධ්‍යයන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්;

(iii) බලසන අණදෙන නිලධරයන්;

(iv) II වන ශ්‍රේණියේ මාණ්ඩලික නිලධරයා;

(v) ක්‍රීඩා නිලධරයා;

(vi) නිවස්න කළමනාකරු;

(vii) ඛණ්ඩ භාර අණදෙන නිලධරයා;

(viii) පුහුණු සහායක නිලධරයා.

(2) පීඨ මණ්ඩලයක පත්කරනු ලබන සියලු සාමාජිකයන් ඔහුගේ පත්වීමේ දිනයේ සිට ගණන් ගැනෙන පරිදි අවුරුදු දෙකක කාලයක් සඳහා ධුර දැරිය යුතු ය.

(3) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා පීඨ මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු අතර, පීඨ මණ්ඩලයේ සියලු රැස්වීම්වලදී මුලසුන දැරිය යුතු ය. පීඨයේ පීඨාධිපතිවරයාට එවැනි යම් රැස්වීමක මුලසුන දැරීමට නොහැකි වන්නේ නම් උපකුලපතිවරයා විසින් එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා පීඨ මණ්ඩලයේ සාමාජිකයකු නම් කරනු ලැබිය යුතු ය.

(4) (අ) ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරයා, විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය අධ්‍යයන පීඨවල පීඨ මණ්ඩලයේ ලේකම්වරයා ලෙස කටයුතු කළ යුතු ය.

(ආ) II වන ශ්‍රේණියේ මාණ්ඩලික නිලධරයකු විශ්වවිද්‍යාලයේ ආරක්ෂක සහ ක්‍රමෝපාය අධ්‍යයන පීඨයේ පීඨ මණ්ඩලයේ ලේකම්වරයා ලෙස කටයුතු කළ යුතු ය.

(5) උපකුලපතිවරයාට සහ නියෝජ්‍ය උපකුලපතිවරයාට පීඨ මණ්ඩලයේ යම් රැස්වීමකට පැමිණීමට හිමිකම තිබිය යුතු ය.

VI වන කොටස

**විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවය**

විශ්ව විද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වීම.

**25.** (1) විශ්වවිද්‍යාලය විසින්, උපාධි ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය හැකි පරිදි වූ යම් දිනයක හෝ දිනවල සෑම වසරකට වරක් සාමාන්‍ය උපාධි ප්‍රදානෝත්සවයක් පවත්වනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වෙනත් යම් අවස්ථාවක දී විශ්වවිද්‍යාලයක් විසින් විශේෂ උපාධි ප්‍රදානෝත්සවයක් පවත්වනු ලැබිය හැකි ය.

(2) උපාධි ප්‍රදානෝත්සවයක් පැවැත්වීම සඳහා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය යුතු ය.

(3) ජනාධිපතිවරයා උපාධි ප්‍රදානෝත්සවයක් සඳහා පැමිණ සිටින අවස්ථාවක දී, ඔහු විසින් එහි මුලසුන දරනු ලැබිය යුතු ය. ජනාධිපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක දී, කුලපතිවරයා විසින් එම උපාධි ප්‍රදානෝත්සවයේ මුලසුන දැරිය යුතු අතර, ජනාධිපතිවරයා සහ කුලපතිවරයා යන දෙදෙනාම නොපැමිණි අවස්ථාවක උපකුලපතිවරයා විසින් එම උපාධි ප්‍රදානෝත්සවයේ මුලසුන දැරිය යුතු ය.

VII වන කොටස

**විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය**

**26.** නියමාවලි මගින් නියම කරනු ලබන පරිදි බඳවා ගැනීමේ පටිපාටි සහ කාර්ය පටිපාටිවලට අනුකූලව විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට කරනු ලබන සෑම පත්කිරීමක්ම මණ්ඩලය විසින් කරනු ලැබිය යුතු ය.

මණ්ඩලය විසින් විශ්ව විද්‍යාලයේ කාර්ය මණ්ඩලය පත් කළ යුතු බව.

**27.** විශ්වවිද්‍යාලයේ සියලු ගුරුවරුන්ගේ සහ සියලු අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සුදුසුකම් සහ පාරිශ්‍රමික, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවාගන්නා ලද හෝ පිහිටුවා ගනු ලැබූ ලෙස සලකන ලද විශ්වවිද්‍යාල විසින් ගුරුවරුන් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අදාළව නිශ්චය කරන ලද සුදුසුකම් සහ පාරිශ්‍රමිකවලට අඩු නොවිය යුතු ය.

විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ සුදුසුකම් නිශ්චය කිරීම.

**28.** (1) ගුරුවරයකුගේ තනතුර සඳහා වන සෑම පත්කිරීමක් ම මණ්ඩලය විසින් සිදු කරනු ලැබිය යුතු අතර, එකී සෑම පත්කිරීමක් ම පළමු අවස්ථාවේ දී මණ්ඩලය විසින් නියමාවලි මගින් දීර්ඝ කරනු ලැබිය හැකි අවුරුදු තුනක පරිවාස කාලයක් සඳහා විය යුතු ය. පරිවාස කාලය අවසානයේ දී, නියමාවලි මගින් නියම කර ඇති පරිදි උචිත බඳවා ගැනීමේ පටිපාටි මගින් විධිවිධාන සලසා ඇති ස්ථිර කිරීම සම්බන්ධයෙන් වන නියමයන් හෝ කොන්දේසිවලට අනුකූලව එම පත්වීම ස්ථිර කරනු ලැබිය හැකි ය:

පරිවාස කාලය සහ ස්ථිර කිරීම.

එසේ වුව ද, එම පත් කිරීම ගුරුවරයකුගේ තනතුර සඳහා වන විට දී සහ පත් කරන ලද තැනැත්තා, ඔහු අනුයුක්ත කර ඇති රාජ්‍ය අංශයේ ආයතනයක වෙනත් යම් දෙපාර්තමේන්තුවක ගුරුවරයකුගේ හෝ ගුරුවරයකුට සමාන වන තනතුරක ඊට පූර්වයෙන් ස්ථිර කර ඇති විට දී, එම පත්කිරීම පළමු අවස්ථාවේ දී අවුරුදු එකක පරිවාස කාලසීමාවක් සඳහා විය යුතු ය.

(2) අනධ්‍යයන තනතුරක් සඳහා වන සෑම පත්කිරීමක් ම මණ්ඩලය විසින් සිදුකරනු ලැබිය යුතු අතර, එකී සෑම පත්කිරීමක් ම පළමු අවස්ථාවේ දී මණ්ඩලය විසින් නියමාවලි මගින් දීර්ඝ කරනු ලැබිය හැකි අවුරුදු එකක පරිවාස කාලයක් සඳහා විය යුතු ය. පරිවාස කාලය අවසානයේ දී, නියමාවලි මගින් නියම කර ඇති උචිත බඳවා ගැනීමේ පටිපාටි මගින් විධිවිධාන සලසා ඇති ස්ථිර කිරීම

සම්බන්ධයෙන් වන නියමයන් හෝ කොන්දේසිවලට අනුකූලව එම පත්වීම ස්ථිර කරනු ලැබිය හැකි ය:

එසේ වුවද, එම පත් කිරීම අනධ්‍යයන තනතුරක් සඳහා වන විට දී සහ පත් කරන ලද තැනැත්තා, ඔහු අනුයුක්ත කර ඇති රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයේ ආයතනයක අනධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරකට සමාන වන තනතුරක ඊට පූර්වයෙන් ස්ථිර කර ඇති විට දී, එම පත්කිරීම පළමු අවස්ථාවේ දී අවුරුදු එකක පරිවාස කාලසීමාවක් සඳහා විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති කථිකාචාර්යවරයකු (පරිවාස) සඳහා වන පරිවාස කාලය නියමාවලිය මඟින් නියම කරනු ලැබිය හැකි පරිදි යම් කාලයක් සඳහා විය යුතු ය.

ගුරුවරුන් සහ අනධ්‍යයන තනතුරක් දරන තැනැත්තන්ගේ විශ්‍රාම ගැනීම.

**29.** (1) සිය තනතුරේ ස්ථිර කොට ඇති ගුරුවරයකු වශයෙන් තනතුරක් දරන්නකු, ඔහු විසින් වයස අවුරුදු හැට පහ සම්පූර්ණ කරනු ලබන තෙක් ධුරය දැරිය යුතු ය:

එසේ වුව ද, එවැනි යම් තනතුරක් දරන්නකු විසින්යම් අවස්ථාවකදී මණ්ඩලය විසින් කරනු ලැබීමට නියමිත පරීක්ෂණයකට යටත්ව විෂමාචාරය, අකාර්යක්ෂමතාවය හෝ කාර්ය පැහැර හැරීම සම්බන්ධයෙන් සේවය අත්හිටුවනු ලැබිය හැකි අතර එම පරීක්ෂණයෙන් පසුව වැරදිකරු කරනු ලැබුවහොත්, මණ්ඩලය විසින් සම්මත කරනු ලබන යෝජනා සම්මතයන් මත සේවයෙන් පහකිරීම හෝ අනිවාර්ය විශ්‍රාම ගැන්වීම කළ හැකි ය.

(2) විශ්වවිද්‍යාලයේ යම් අනධ්‍යයන තනතුරක් දරන තැනැත්තන්ගේ විශ්‍රාම යාමේ වයස සම්බන්ධයෙන්, රජයේ නිලධරයන්ගේ විශ්‍රාම යාමේ වයස සම්බන්ධයෙන් වන ආයතන සංග්‍රහයේ විධිවිධාන, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රීති අදාළ වන්නේ ය.

(3) 28 වන වගන්තියේ දක්වා ඇති පරිවාස කාලය සම්පූර්ණ කිරීමට පෙර-

(අ) ගුරුවරයකුගේ තනතුර දරන යම් තැනැත්තකු වයස අවුරුදු හැටපහට ළඟාවන අවස්ථාවක දී; හෝ

(ආ) අනධ්‍යයන තනතුරක් දරන යම් තැනැත්තකු (2) වන උපවගන්තියේ සඳහන් ආයතන සංග්‍රහයේ විධිවිධාන,

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රීතිවල නිශ්චිතව සඳහන් විශ්‍රාම ගැනීමේ වයසට ළඟාවන අවස්ථාවක දී,

එම තැනැත්තා එම වයසට ළඟා වූ දිනයේ සිට සේවයෙන් විශ්‍රාම ගෙන ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සිය තනතුරෙහි සේවයෙන පහකරනු ලැබූ හෝ අනිවාර්ය විශ්‍රාම යවනු ලැබූ හෝ අන්‍යාකාරයකින් විෂමාචාරය, අකාර්යක්ෂමතාවය හෝ කාර්ය පැහැර හැරීම සඳහා දඬුවම් කරනු ලැබූ විශ්වවිද්‍යාලයේ යම් තනතුරක් දරන සෑම තැනැත්තකු විසින් එම සේවයෙන් පහකිරීමට හෝ අනිවාර්ය විශ්‍රාම යැවීමට හෝ වෙනත් දඬුවමකට එරෙහිව මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය නිලධරයන් පත් කිරීම.

**30.** (1) මණ්ඩලයේ ඉල්ලීම මත, රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු, ඒ නිලධරයාගේ හෝ එම නිලධරයා සේවයේ යෙදී සිටින අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ, රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමතය ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාලයේ ගුරුවරයකුගේ තනතුරකට තාවකාලිකව හෝ ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) 1991 අංක 31 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, විශ්වවිද්‍යාල ගුරුවරයකුගේ තනතුරට තාවකාලිකව පත් කරන ලද රාජ්‍ය සේවයේ යම් නිලධරයකු සඳහා ද, ඔහු සම්බන්ධයෙන් ද , අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(3) එම පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, විශ්වවිද්‍යාල ගුරුවරයකුගේ තනතුරට ස්ථිරව පත් කරන ලද රාජ්‍ය සේවයේ යම් නිලධරයකු සඳහා ද, ඔහු සම්බන්ධයෙන් ද, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(4) නිශ්චිතව සඳහන් කාලසීමාවක් තුළ ආණ්ඩුවට සේවය කිරීමට එකඟවෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකු විශ්වවිද්‍යාලය විසින් සේවයෙහි යොදවනු ලබන

අවස්ථාවක එම තැනැත්තා විසින් ඒ විශ්වවිද්‍යාලය යටතේ යම් කාල සීමාවක් සේවය කිරීම ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

කාර්ය මණ්ඩලයේ විනය පාලනය.

31. ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අගතියක් නොමැතිව මේ පනත යටතේ සාදන ලද නියෝග, (357 වන අධිකාරය වූ) යුධ හමුදා පනතේ, (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ, (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදනු ලබන නියෝග, අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාලයේ කාර්යය මණ්ඩලයේ විනය පාලනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

VIII වන කොටස

## මුදල්

විශ්වවිද්‍යාල අරමුදල.

**32.** විශ්වවිද්‍යාලයට එහිම අරමුදලක් තිබිය යුතු අතර, එම අරමුදල-

(අ) 33 වන හා 38 වන වගන්ති යටතේ විශ්වවිද්‍යාලයේ පාවිච්චිය සඳහා පාර්ලිමේන්තුව විසින් සපයනු ලබන සියලු මුදල් ප්‍රමාණයන්;

(ආ) පරිත්‍යාග හෝ ප්‍රදාන ආකාරයෙන් කවර හෝ මූලාශ්‍රයකින් විශ්වවිද්‍යාලයට ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන්;

(ඇ) මණ්ඩලය විසින් අනුමත කරනු ලබන යම් කාර්යයක් සඳහා විශ්වවිද්‍යාලයට ගෙවනු ලබන ගාස්තු;

(ඈ) විශ්වවිද්‍යාලය සමග ඇති කරගත් යම් ගිවිසුමක් ඉටු කිරීම වෙනුවෙන් විශ්වවිද්‍යාලයට ගෙවනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන්;

(ඉ) විශ්වවිද්‍යාලය විසින් සපයනු ලබන යම් සේවාවක් වෙනුවෙන් විශ්වවිද්‍යාලයට ජනනය වන යම් ආදායමක්; සහ

(ඊ) මේ පනත යටතේ සාදනු ලබන යම් රීතියක් හෝ නියෝගයක් අනුව විශ්වවිද්‍යාලයට ලැබීමට නියමිත වෙනත් යම් ගෙවීම්,

බැර කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ විශ්වවිද්‍යාලය විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී විශ්වවිද්‍යාලය දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල්, විශ්වවිද්‍යාලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

විශ්වවිද්‍යාලයට ආධාර පිණිස ලබා දෙන ප්‍රදාන.

**33.** වාර්ෂික විසර්ජනය, පරිපූරක ඇස්තමේන්තු හෝ අන්‍යාකාරයකින් විශ්වවිද්‍යාලයට ආධාර පිණිස ප්‍රදාන වශයෙන් පාර්ලිමේන්තුව විසින් විශ්වවිද්‍යාලයට ලබා දී ඇති එක් එක් මුදල් ප්‍රමාණයන් වර්ෂය ආරම්භ වූ පසු ප්‍රායෝගිකව හැකි ඉක්මනින් මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින්, විශ්වවිද්‍යාලයට ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලය විසින් අය වැය ඇස්තමේන්තු සහ වාර්ෂික මුදල් විසර්ජන සලකා බැලිය යුතු බව.

**34.** 35 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ මුල්‍යාධිකාරීවරයාගේ සහාය ඇතිව පිළියෙල කරන ලද විශ්වවිද්‍යාලයේ අයවැය ඇස්තමේන්තු සහ වාර්ෂික මුදල් විසර්ජන, අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි යම් දිනයකට පෙර මණ්ඩලය විසින් සලකා බලනු ලැබිය යුතු ය. මණ්ඩලය විසින්, එකී ඇස්තමේන්තුවලට සහ මුදල් විසර්ජනවලට මණ්ඩලය විසින් සුදුසු යයි සලකනු ලබන වෙනස් කිරීම් සිදු කළ හැකි අතර, සම්පූර්ණ කරන ලද මුදල් වර්ෂය සඳහා වන විශ්වවිද්‍යාලයේ ගිණුම් සමග එකී වෙනස් කරන ලද ඇස්තමේන්තු සහ මුදල් විසර්ජන අමාත්‍යවරයාට ඉදිරිපත් කළයුතු අතර, අමාත්‍යවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවක දී එම ඇස්තමේන්තු සහ මුදල් විසර්ජන සංශෝධනය කරනු ලැබිය හැකි ය.

මුල්‍යාධිකාරීවරයාගේ කාර්ය.

**35.** විශ්වවිද්‍යාලයේ මුල්‍යාධිකාරීවරයාගේ කාර්යය විය යුත්තේ -

(අ) රීති මගින් නියම කරනු ලැබිය හැකි ආකාරයට සහ ආකෘතියට අනුව විශ්වවිද්‍යාලයේ ගිණුම් තැබීම සහ පවත්වාගෙන යාම;

(ආ) විශ්වවිද්‍යාල අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් ලබා ගැනීම සහ එම මුදල් සුදුසු ගිණුම් ශීර්ෂවලට බැර කිරීම;

(ඇ) සියලු බලය ලත් ගෙවීම් සිදු කිරීම;

(ඇ) අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී සහ විශ්වවිද්‍යාලයේ වාර්ෂික මුදල් විසර්ජන පිළියෙල කිරීමේ දී මණ්ඩලයට සහය වීම; සහ

(ඉ) මේ පනතේ 39 වන වගන්තිය යටතේ අවශ්‍ය අවස්ථාවල දී යම් පරිපූරක ඇස්තමේන්තු පිළියෙල කිරීම,

වන්නේ ය.

**විශේෂ කාර්ය සඳහා කරන ලද ප්‍රදානයන්ගෙන් ලැබෙන ආදායම වෙන් වෙන්ව ගිණුම්ගත කිරීම.**

**36.** විශේෂ කාර්ය සඳහා ලබා දී ඇති ප්‍රදානවලින් හෝ විශේෂ අරමුණු සඳහා වූ පරිත්‍යාගවලින් විශ්වවිද්‍යාලයට ලැබෙන ආදායම විශ්වවිද්‍යාලයේ ගිණුම්වල වෙන් වෙන්ව ගිණුම්ගත කළ යුතු අතර, එකී ප්‍රදාන හෝ පරිත්‍යාග ලබා දී ඇත්තේ යම් අරමුණු හෝ කාර්ය සඳහාද, එම අරමුණු හෝ කාර්යය සඳහා හැර විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය කාර්ය සඳහා එකී ආදායමෙන් කිසිම ගෙවීමක් නොකළ යුතු ය.

**මණ්ඩලය විසින් අය වැය ඇස්තමේන්තු සහ වාර්ෂික මුදල් විසර්ජන සම්මත කළ යුතු බව.**

**37.** මණ්ඩලය විසින් විශ්වවිද්‍යාලයේ අයවැය ඇස්තමේන්තු, වාර්ෂික මුදල් විසර්ජන සහ වාර්ෂික ගිණුම්, 34 වන වගන්තිය යටතේ අමාත්‍යවරයාට ඉදිරිපත් කිරීමට පෙරාතුව එම අයවැය ඇස්තමේන්තු, වාර්ෂික මුදල් විසර්ජන සහ වාර්ෂික ගිණුම්, යෝජනා සම්මතයක් මගින් සම්මත කරගත යුතු ය.

**එක් වැය ශීර්ෂයක සිට තවත් වැය ශීර්ෂයකට අරමුදල් මාරු කිරීම.**

**38.** මණ්ඩලය විසින් අවශ්‍ය අවස්ථාවන්හි දී භාණ්ඩාගාරයේ ලිඛිත අනුමතයට යටත්ව, වාර්ෂික ඇස්තමේන්තුවල එක් වැය ශීර්ෂයක සිට වෙනත් වැය ශීර්ෂයකට අරමුදල් පැවරීම කරනු ලැබිය හැකි ය.

**පරිපූරක ඇස්තමේන්තු.**

**39.** (1) අවශ්‍ය අවස්ථාවක දී සහ යම් අනපේක්ෂිත වියදමක් පියවීම සඳහා මුල්‍යාධිකාරීවරයා විසින් යම් අවස්ථාවකදී වියදම් පිළිබඳ පරිපූරක ඇස්තමේන්තු සකස් කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සකස් කරන ලද පරිපූරක ඇස්තමේන්තු මණ්ඩලය විසින් සම්මත කිරීම සඳහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, සම්මත කිරීමෙන් අනතුරුව, එම ඇස්තමේන්තු ඉදිරි අවුරුද්ද සඳහා වන වාර්ෂික විසර්ජන ද සමඟ අමාත්‍යවරයා වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

(3) පුනරාවර්තන ස්වභාවයේ මුල්‍ය වියදම් අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව දෙන ලද පූර්ව අනුමතය නොමැතිව දරනු නොලැබිය යුතු ය.

*මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.*

**40.** (1) විශ්වවිද්‍යාලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන විශ්වවිද්‍යාලයේ ගිණුම් විගණනය කිරීම සඳහා ද ඒ සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

*විගණනය කළ ගිණුම් පළ කිරීම.*

**41.** විශ්වවිද්‍යාලයේ එක් එක් මුදල් වර්ෂය සඳහා වන ගිණුම් විගණනය කළ පසු ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

*වාර්ෂික ගිණුම් සහ විගණකාධිපතිවරයාගේ වාර්තාව අමාත්‍යවරයා වෙත ප්‍රේෂණය කළ යුතු බව.*

**42.** (1) විශ්වවිද්‍යාලය විසින්, එක් එක් මුදල් වර්ෂයට සම්බන්ධ විගණකාධිපතිවරයාගේ වාර්තාව ලැබීමෙන් මාස තුනක් ඇතුළත දී එම වාර්තාව, මණ්ඩලය විසින් ඒ සම්බන්ධයෙන් කරන ලද යම් අදහස් ද එම වාර්තාව අදාළ වන ගිණුම් ප්‍රකාශය ද සමග අමාත්‍යවරයා වෙත ප්‍රේෂණය කළ යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ තමා වෙත ප්‍රේෂණය කරන ලද සියලු ලේඛනවල පිටපත් එම ලේඛන අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂය අවසන් වීමට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට සැලැස්විය යුතු ය.

## IX වන කොටස

## සාමාන්‍ය විධිවිධාන

*විශ්වවිද්‍යාලයේ යම් අධිකාරියක සාමාජිකයන් වීමට නුසුදුසුකම්.*

**43.** යම් තැනැත්තකු—

(අ) නිදහස් කරනු නොලැබූ, බංකොලොත්භාවයෙන් හෝ බුන්වත්භාවයෙන් යුතු තැනැත්තෙක් නම්;

(ආ) චරිත දූෂණ වරදක් ඇතුළු යම් වරදකට ඔහු වරදකරු වී ඇත්නම්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කර ඇත්නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම්;

(ඈ) විශ්වවිද්‍යාලය විසින් හෝ එය වෙනුවෙන් ඇති කර ගත් තමාගේ සේවය පිළිබඳ ගිවිසුම හැර, වෙනත් යම්

ගිවිසුමක් යටතේ කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් එම තැනැත්තා විසින්ම හෝ ඔහු වෙනුවෙන් ඔහුගේ ප්‍රයෝජනය හෝ ප්‍රතිලාභය සඳහා වෙනත් තැනැත්තකු විසින් යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් දරන්නේ නම් හෝ බුක්ති විඳින්නේ නම්;

(ඉ) ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වේ නම් හෝ එසේ වුවහොත් හෝ පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ එසේ වුවහොත්;

(ඊ) ඔහු විෂමාචාරය සඳහා යම් කෘත්‍යමය ආයතනයක සාමාජිකත්වයෙන් හෝ විශ්වවිද්‍යාලයේ යම් ධුරයකින් ඉවත් කරනු ලැබ ඇත්නම්;

(උ) නොහැකියාව, අයහපත් සෞඛ්‍ය තත්ත්වය හෝ ශාරීරික හෝ මානසික අශක්නුතාව හේතුවෙන් කෘත්‍යමය ආයතනයක හෝ මණ්ඩලයක සාමාජිකයකු වශයෙන් කටයුතු කරගෙන යාමට හෝ නොකඩවා ධුර දැරීමට නුසුදුසු බව සොයාගනු ලැබූ අවස්ථාවක;

(ඌ) විෂමාචාරය හෝ දූෂණය සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ අවස්ථාවක; හෝ

(එ) සිය ධුරයේ බලතල බරපතල ලෙස අනිසි ආකාරයෙන් යොදාගැනීම සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ අවස්ථාවක,

එම තැනැත්තා, විශ්වවිද්‍යාලයේ යම් කෘත්‍යමය ආයතනයක හෝ මණ්ඩලයක සාමාජිකයකු ලෙස හෝ විශ්වවිද්‍යාලයේ නිලධරයකු ලෙස පත් කරනු ලැබීමට හෝ එසේ කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු වන්නේ ය.

ජාතික ආරක්ෂාව පිළිබඳ සුහසිද්ධිය සඳහා තොරතුරු ලබාදීමට නියම කිරීම සඳහා මණ්ඩලය සතු බලතල.

**44.** (1) ජාතික ආරක්ෂාව පිළිබඳ සුහසිද්ධිය සඳහා, අවස්ථාවෝචිත පරිදි සිය බඳවා ගැනීමේ හෝ පත් කිරීමේ අවස්ථාවේ දී යම් අනුනීතියකින් නියම කරනු ලැබිය හැකි යම් තොරතුරු ලබා දෙන ලෙස මණ්ඩලය විසින් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයකු ලෙස හෝ සේවා නියුක්තිකයකු ලෙස ඇතුළත් කර ගනු ලබන යම් තැනැත්තකු වෙත නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් එම නියමයට අනුකූලව කටයුතු කළ යුතු ය.

*විශ්වවිද්‍යාලයේ නිලධරයන් සහ සේවකයන් දණ්ඩනීති සංග්‍රහය යටතේ රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.*

**45.** විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ සියලු නිලධරයන් සහ සාමාජිකයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයට අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

*විශ්වවිද්‍යාලය අල්ලස් පනතට අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.*

**46.** විශ්වවිද්‍යාලය අල්ලස් පනතට අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

*යම් තැනැත්තන් විශ්වවිද්‍යාල භූමියට ඇතුළුවීම තහනම් කිරීම.*

**47.** (1) විශ්වවිද්‍යාලයේ යම් නිලධරයකු, කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු හෝ ශිෂ්‍යයකු හැර යම් තැනැත්තකු විශ්වවිද්‍යාලය තුළට පැමිණීම උපකුලපතිවරයාගේ මතය අනුව විශ්වවිද්‍යාලයේ හෝ එහි ශිෂ්‍යයන්ගේ සුභසාධනයට හිතකර නොවන අවස්ථාවක දී, උපකුලපතිවරයා විසින් හෝ උපකුලපතිවරයා විසින් තත්කාර්ය සඳහා ලිඛිතව බලය ලබා දෙන ලද යම් නිලධරයකු විසින් එම තැනැත්තාට කරුණු ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් ලබා දීමෙන් පසු එම තැනැත්තාට විශ්වවිද්‍යාල භූමියට හෝ එකී දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති විශ්වවිද්‍යාලයේ යම් කොටසකට ඇතුළුවීම හෝ එහි රැඳී සිටීම තහනම් කරමින් එම තැනැත්තා වෙත සිය අත්සන සඳහන් දැන්වීමක් භාර දෙනු ලැබිය හැකි ය. එම තහනම මණ්ඩලය විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන තෙක් බලාත්මකව පැවතිය යුතු ය.

(2) එම සහතිකයෙහි නම් කරනු ලැබූ යම් තැනැත්තකුට විශ්වවිද්‍යාල භූමිය තුළට හෝ එහි යම් කොටසකට ඇතුළුවීම හෝ එහි රැඳීසිටීම හෝ තහනම් කරමින් (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුව උපකුලපතිවරයාගේ අත්සන යටතේ වූ නිකුත්

කොට ඇති සහතිකයක්, පටහැනිව කරුණු ඔප්පු කරනු ලබන තෙක් යම් අධිකරණයක් විසින්, එම සහතිකයේ සඳහන් කොට ඇති කරුණු සාක්ෂි වශයෙන් පිළිගෙන භාර ගත යුතු අතර එම සහතිකය උපකුලපතිවරයා විසින් නිකුත් කළ සහතිකයක් ලෙස සැලකිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ විශ්වවිද්‍යාල භූමිය තුළට හෝ එහි යම් කොටසකට ඇතුළුවීම හෝ එහි නතරව සිටීම තහනම් කොට ඇත්තේ යම් තැනැත්තකුටද, එම තැනැත්තා එම තහනම කඩ කරමින් සාධාරණ හේතුවක් නොමැතිව එහි භූමියට හෝ එම යම් කොටසකට ඇතුල් වන්නේ නම් හෝ එහි නතරව සිටි එක් එක් දිනය හෝ ඉන් කොටසක් සම්බන්ධයෙන් රුපියල් දසදහසක දඩයකට යටත් විය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වූ වරදක් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංඥෙය සහ ඇප දිය හැකි වරදක් විය යුතු ය.

ප්‍රඥප්ති.

**48.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් පහත සඳහන් කාරණා සියල්ල හෝ ඉන් යම් කරුණක් යමක් සම්බන්ධයෙන් ප්‍රඥප්ති සාදනු ලැබිය හැකි ය:-

(අ) මණ්ඩලය විසින් බලතල, කර්තව්‍ය සහ කාර්ය උප කුලපතිවරයා සහ කෘත්‍යමය ආයතන වෙත පැවරීම;

(ආ) අන්‍යාකාරයකින් විධිවිධාන සලසා නොමැති විට දී විශ්වවිද්‍යාලයේ යම් කෘත්‍යමය ආයතතනයක පුරප්පාඩු පිරවීම සහ එම ආයතනය කැඳවීම;

(ඇ) ප්‍රදානය කරනු ලබන උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා නිශ්චය කිරීම;

(ඈ) ගෞරව උපාධි හෝ වෙනත් විශිෂ්ටතා ප්‍රදානය කිරීම;

(ඉ) කවර හෝ යම් ආකාරයකින් සපයනු ලැබිය හැකි අරමුදල් හෝ දේපළවලින් අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ර දක්ෂිණ, ශිෂ්‍යාධාර, පදක්කම් සහ අනෙකුත් ත්‍යාග ඇති කිරීම සහ ප්‍රදානය කිරීම; සහ

(ඊ) මේ පනතේ විධිවිධාන යටතේ ව්‍යවස්ථා සෑදීම සඳහා බලය දී ඇති හෝ නියම කොට ඇති සියලු කාරණා.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම ප්‍රඥප්තියක්ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දිනයේ දී හෝ එක් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් දිනයකදී එම ප්‍රඥප්තිය බලාත්මක විය යුතු ය.

අතුරු ව්‍යවස්ථා.

**49.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් ප්‍රඥප්ති සකස් කරනු ලැබිය හැකි ය:-

(අ) උපාධි, ඩිප්ලෝමා, සහතිකපත් සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අධ්‍යයන පාඨමාලා;

(ආ) උපාධි, ඩිප්ලෝමා, සහතිකපත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා සඳහා නියමිත අධ්‍යයන පාඨමාලා සහ විභාගවලට ඇතුළත් කර ගැනීම සඳහා ශිෂ්‍යයන් විසින් යටත් විය යුතු කොන්දේසි;

(ඇ) අධ්‍යයන පාඨමාලා, විභාග සහ උපාධි, ඩිප්ලෝමා, සහතිකපත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා අය කළ යුතු ගාස්තු;

(ඈ) විශ්වවිද්‍යාලයේ විවිධ කෘත්‍යමය ආයතන සහ මණ්ඩලවලට නියෝජිතයන් නම් කිරීම සම්බන්ධයෙන් අදාළ සියලු කාරණා;

(ඉ) විභාග පරීක්ෂකවරුන් පත් කිරීමේ ක්‍රමය සහ ඒ සඳහා වන කොන්දේසි, ඔවුන්ගේ කාර්ය, ඔවුනට ගෙවිය යුතු ගාස්තු සහ ඔවුන්ගේ හැසිරීම සහ විභාගවල ප්‍රමිතිය පවත්වාගෙන යාම; සහ

(ඊ) මේ පනතේ විධිවිධාන යටතේ අතුරු ව්‍යවස්ථා සෑදීම සඳහා බලය දී ඇත්තේ හෝ නියම කොට ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද එම සියලු කාරණා.

(2) සනාතන සභාව විසින් විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම් හෝ විභාග සම්බන්ධ හෝ ඊට අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් වන යම් අතුරු ව්‍යවස්ථාවක කෙටුම්පතක් පළමුව සකස් කොට සභාව මගින් මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන තෙක් එවැනි යම් අතුරු ව්‍යවස්ථාවක් මණ්ඩලය විසින් සකස් නොකළ යුතු ය.

(3) මණ්ඩලය විසින් සකස් කරනු ලබන සෑම අතුරු ව්‍යවස්ථාවක්ම එහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් දිනයක සිට බලාත්මක විය යුතු ය.

නියෝග.

**50.** (1) නියම කරනු ලැබිය යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදිය යුතු යයි මේ පනතින් බලය දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින හෝ ඒ නියෝගයේ සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, එය *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් ඒ අනනුමතයේ දින පටන් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ කලින් කරන ලද යම් දෙයකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

රීති.

**51.** මණ්ඩලය විසින්, මේ පනතේ විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන සියලු කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය:-

(අ) මේ පනතේ විධිවිධාන යටතේ රීති සෑදීම සඳහා නියම කොට ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද, එම කාරණා; සහ

(ආ) මේ පනත යටතේ විශ්වවිද්‍යාලයේ කෘත්‍යමය ආයතනවලට සිය කාර්යය සහ කර්තව්‍යය කරගෙන යාමට හැකිවීම සඳහා විධිවිධාන සැලසිය යුතු කාරණා.

නියමාවලි.

**52.** මේ පනතේ විධිවිධානවලට යටත්ව, මේ පනත යටතේ නියමාවලි සෑදීම සඳහා නියමකොට ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද, එම කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය විසින් නියමාවලි සාදනු ලැබිය හැකි ය.

ඛනිජ ද්‍රව්‍ය ජනරජයේ පරම දේපළක් ලෙස තිබිය යුතු බව.

**53.** විශ්වවිද්‍යාලයට පවරා ඇති යම් ඉඩමක, ඉඩමක් තුළ හෝ ඒ මතුපිට හමුවන යම් ඛනිජ ද්‍රව්‍යයක් ජනරජයේ පරම දේපළක් ලෙස තිබිය යුතු අතර, එසේ තිබෙන බවට සැලකිය යුතු ය.

1978 අංක 16 දරන පනතේ විධිවිධාන අදාළ නොවන බව.

**54.** සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන මේ පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයට හෝ ඒ සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

නිශ්චිත පනත් අදාළ වන බව.

**55.** විශ්වවිද්‍යාලයේ ගුරුවරුන් සහ අනධ්‍යන කාර්ය මණ්ඩලයේ විශ්‍රාම පාරිතෝෂික සම්බන්ධයෙන්, 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ විධිවිධාන, 1980 අංක 48 දරන සේවක භාර අරමුදල් පනතේ විධිවිධාන සහ 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

ඉවත් කිරීම සහ ඉතිරි කිරීම්.

**56.** (1) 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතනය පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියෝගයක් මගින් එකී ඉවත් කිරීම බලාත්මක විය යුතු දිනය නියම කරනු ලැබිය යුතු ය.

(3) එකී ඉවත් කිරීම නොතකා, ඉවත් කිරීම සිදු කළ දිනට පෙර දිනයේ දී -

(අ) ඉවත් කරන ලද පනත යටතේ පත් කරන ලද කුලපති ධුර දරන තැනැත්තකු, එකී ඉවත් කිරීමේ දින සිට බලපැවැත්වෙන පරිදි මේ පනත යටතේ පත්කරන ලද

කුලපතිවරයා ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔහුගේ ධුර කාලය අවසන් වන තෙක් විශ්වවිද්‍යාලයේ කුලපතිවරයා ලෙස නොකඩවා ධුරය දැරිය යුතු ය;

(ආ) ඉවත් කරන ලද පනත යටතේ පත් කරන ලද සේනා විධායක නිලධර ධුර දරන තැනැත්තකු, එකී ඉවත් කිරීමේ දින සිට බලපැවැත්වෙන පරිදි, මේ පනත යටතේ පත් කරන ලද උපකුලපතිවරයා ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔහුගේ ධුර කාලය අවසන් වන තෙක් විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා ලෙස නොකඩවා ධුරය දැරිය යුතු ය;

(ඇ) ඉවත් කරන ලද පනත යටතේ පත් කරන ලද නිලධරයන් සහ සේවකයන්, එකී ඉවත් කිරීමේ දින සිට බලපැවැත්වෙන පරිදි, මේ පනත යටතේ පත් කරන ලද නිලධරයන් සහ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔවුන් හිමිකම් කියූ සේවා නියුක්තියට අවාසිදායක නොවන සමාන කොන්දේසි මත විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් ලෙස නොකඩවා කටයුතු කරනු ලැබිය යුතු ය.

(4) ඉහත සඳහන් පනත ඉවත් කිරීම නොතකා, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට සහ ඉන් පසුව—

(අ) ඉවත් කරන ලද පනතේ 20(1) වන වගන්තිය යටතේ කරන ලද සහ 1982 පෙබරවාරි 2 දින අංක 182 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද පැවරුම් නියෝගය යටතේ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයට හිමි වූ සියලු චංචල සහ නිශ්චල දේපළ විශ්වවිද්‍යාලය වෙත පවරනු ලැබිය යුතු ය;

(ආ) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින්නා වූ සියලු ණය, බැඳීම් සහ දරන ලද වගකීම් සහ ඇතුළත් වූ සියලු ගිවිසුම් සහ එකඟතා සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් හෝ එය සමග නිරතවන්නා වූ හෝ කිරීමට එකඟ වූ සියලු කාරණා සහ දෑ, ණය, බැඳීම්, වත්කම් සහ දරන ලද වගකීම් සහ ඇතුළත් වූ ගිවිසුම් සහ

එකඟතා සමග නිරත වන්නා වූ හෝ කිරීමට එකඟ වූ සියලු කරුණු සහ දෑ ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයයේ අරමුදලේ බැරට ඇති සියලු මුදල් එම දිනයේ සිට බලාත්මක වන පරිදි මෙම පනතේ 32 වගන්තිය මගින් පිහිටුවන ලද අරමුදලට මාරු කරනු ලැබිය යුතු ය;

(ඈ) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ සියලු අයිතිවාසිකම්, අයිතීන් සහ වගකීම් විශ්වවිද්‍යාලයේ අයිතිවාසිකම්, අයිතීන් සහ වගකීම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඉ) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය විසින් හෝ එයට එරෙහිව ගොනු කරන ලද, ශ්‍රී ලංකාවේ යම් අධිකරණයක තීරණයක් ලබා දීමට නියමිතව ඇති යම් නඩු, නඩු පැවරීම්, අභියාචන හෝ අනෙකුත් නීත්‍යානුකූල නඩු කටයුතු, විශ්වවිද්‍යාලය විසින් හෝ එයට එරෙහිව ගොනු කරන ලද නඩු, නඩු පැවරීම්, අභියාචන හෝ අනෙකුත් නීත්‍යානුකූල නඩු කටයුතු ලෙස නොකඩවා පවත්වාගෙන යනු ලැබිය යුතු ය;

(ඊ) යම් නඩුවක දී, නඩු කටයුත්තක දී හෝ දෙයක දී යම් අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් විසින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් ඇතුළත් වූ හෝ එයට පක්ෂව හෝ එයට එරෙහිව ලබා දෙන ලද යම් ආඥාවක්, නියෝගයක් හෝ ප්‍රදානයක් නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි විශ්වවිද්‍යාලය විසින් ඇතුළත් වූ හෝ එයට පක්ෂව කරන ලද ආඥාවක්, නියෝගයක් හෝ ප්‍රදානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව බලාත්මක විය යුතු ය;

(උ) ඉවත් කරන ලද පනත යටතේ සාදන ලද සියලු නියමාවලි, ප්‍රඥප්ති, අතුරු ව්‍යවස්ථා, රීති සහ නියෝග මේ පනතේ විධිවිධාන සමග අනනුකූල නොවන්නේ නම් මිස, ඒවා මේ පනත යටතේ සාදනු ලබන තාක්, මේ පනත යටතේ සාදනු ලැබූ නියමාවලි, ප්‍රඥප්ති,අතුරු ව්‍යවස්ථා, රීති සහ නියෝග ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු ය.

(5) ඉහත සඳහන් පනත ඉවත් කිරීම නොතකා, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට සහ ඉන්පසුව—

(අ) යම් ලිඛිත නීතියක, දැන්වීමක, දැනුම්දීමක, සාධන පත්‍රයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට" ඇති සෑම යෙදුමක් ම මේ පනත යටතේ පිහිටුවන ලද "ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයට" කරනු ලබන යෙදුමක් සේ කියවා තේරුම් ගත යුතු ය;

(ආ) යම් ලිඛිත නීතියක, දැන්වීමක, දැනුම්දීමක, සාධනපත්‍රයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලයට" ඇති සෑම යෙදුමක් ම මේ පනත යටතේ පිහිටුවන ලද "ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයට" කරනු ලබන යෙදුමක් සේ කියවා තේරුම් ගත යුතු ය;

(ඇ) යම් ලිඛිත නීතියක, දැන්වීමක, දැනුම්දීමක, සාධනපත්‍රයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ සේනාවිධායකට" ඇති සෑම යෙදුමක් ම මේ පනතේ II වන වගන්තියේ (1)වන උපවගන්තිය යටතේ පත් කරන ලද "ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා" කරනු ලබන යෙදුමක් සේ කියවා තේරුම් ගත යුතු ය;

(ඇ) 1978 ජුලි මස 11 වන දින අංක 1292 ඔප්පුවේ සහ 1980 අප්‍රේල් මස 07 වන දින දරන අංක 1389 දරන ඔප්පුවේ කොතලාවලපුර කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතනයට ඇති යම් යෙදුමක් මේ පනත යටතේ පිහිටුවන ලද ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයට ඇති යෙදුමක් සේ සලකනු ලැබිය යුතු ය.

අපහසුතාවයන් ඉවත් කිරීම.

**57.** අමාත්‍යවරයා විසින්, මේ පනතේ කාර්යයන්ට අදාළව පොදු හෝ යම් විශේෂ කාරණයක් සම්බන්ධයෙන් මණ්ඩලයේ නිර්දේශ මත, සහ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයක් මගින්, මේ පනත යටතේ හෝ මේ පනත මගින් ක්‍රියාකාරී විධිවිධාන සලස්වා නොමැති යම් විශේෂ හෝ පූර්වාපේක්ෂණය කළ නොහැකි අවස්ථාවන් සඳහා විධිවිධාන සැලැස්වීමේ අරමුණින් අවශ්‍ය වන්නා වූ යම් විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

නිශ්චල චංචල දේපළ සම්බන්ධ විශේෂ විධිවිධාන.

**58.** කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ශ්‍රී රාගවන් නාරායනස්වාමි විසින් සහතික කරන ලද 1980 අප්‍රේල් මස 7 වන දින අංක 1389 දරන ඔප්පුවේ II වන උපලේඛනයේ විස්තර කරනු ලබන, ශ්‍රීමත් ජෝන් ලයනල් කොතලාවල මහතා විසින් විශ්වවිද්‍යාලයට පවරනු ලැබූ චංචල දේපළ පිළිබඳ ලැයිස්තුවක් අමාත්‍යවරයා විසින්, හැකිතාක් ඉක්මනින් නියමිත දිනයේ සිට *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයක් මගින් පළකරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**59.** මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස—

"ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා" යන්නෙන්,

(අ) ශ්‍රී ලංකා යුධ හමුදාව; හෝ

(ආ) ශ්‍රී ලංකා නාවික හමුදාව; හෝ

(ඇ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව,

අදහස් වේ;

"අතුරු ව්‍යවස්ථා" යන්නෙන්, මේ පනතේ 49 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් සාදනු ලබන අතුරු ව්‍යවස්ථා

අදහස් වේ;

"උපාධිය" යන්නෙන්, විශ්වවිද්‍යාලය මගින් ප්‍රදානය කරනු ලබන ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි අදහස් වේ;

"ඩිප්ලෝමා" යන්නෙන්, විශ්වවිද්‍යාලය මගින් ප්‍රදානය කරනු ලබන උසස් ඩිප්ලෝමා සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා අදහස් වේ;

"ආයතන සංග්‍රහය" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය අදහස් වේ;

"කෘත්‍යමය ආයතනය" යන්නෙන්, මේ පනතේ 20 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් ආයතනයක් අදහස් වේ;

"යුධ පුහුණු ආයතන" යන්නෙන්, ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා යුධ පුහුණු ආයතන අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ;

"අනධ්‍යයන කාර්ය මණ්ඩලය" යන්නෙන්, විශ්වවිද්‍යාලයේ ගුරුවරුන් හැර කාර්ය මණ්ඩලයේ සියලු සාමාජිකයන් අදහස් වන අතර, එයට අධ්‍යාපන උපකාරක කාර්ය මණ්ඩලය, පරිපාලන කාර්ය මණ්ඩලය සහ ලිපිකරු සහ සම්බන්ධිත සේවා ඇතුළත් වේ;

"නියමාවලිය" යන්නෙන්, මණ්ඩලය විසින් මේ පනත යටතේ සාදනු ලබන යම් නියමාවලියක් අදහස් වේ;

"ප්‍රධාන විධායක සහ පරිපාලන නිලධරයා" යන්නෙන්, විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා අදහස් වේ;

"නියෝග" යන්නෙන්, මේ පනතේ 50 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා මගින් සාදනු ලබන නියෝග අදහස් වේ;

"රීති" යන්නෙන්, මේ පනතේ 51 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් සාදනු ලබන රීති අදහස් වේ;

"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරයා" යන්නට, සහකාර ලේඛකාධිකාරිවරයකු ඇතුළත් වේ;

"ප්‍රඥප්තිය" යන්නෙන්, මේ පනතේ 48 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් සාදනු ලබන යම් ප්‍රඥප්තියක් අදහස් වේ;

"ස්ථාවර නියෝග" යන්නෙන්, උපකුලපතිවරයාගේ විධානය මත කලින් කලට නිකුත් කරනු ලබන පරිපාලන විධාන අදහස් වේ;

"අනුනීති" යන්නෙන්, මේ පනතේ විධිවිධාන අනුව සාදනු ලබන යම් නියමාවලියක්, ප්‍රඥප්තියක්, අතුරු ව්‍යවස්ථාවක් හෝ රීතියක් හෝ නියමයක් අදහස් වේ;

"ගුරුවරයා" යන්නෙන්, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙක්, මහාචාර්යවරයෙක්, සහාය මහාචාර්යවරයෙක්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් සහ කථිකාචාර්යවරයෙක් (පරිවාස) අදහස් වන අතර, එයට පුස්තකාලයාධිපතිවරයා, නියෝජ්‍ය පුස්තකාලයාධිපතිවරයා, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරයා සහ සහකාර පුස්තකාලයාධිපතිවරයා ඇතුළත් වේ;

"විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාව අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**60.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.